Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2021), Vol. 06 (02)

# The Multidisciplinary Study on Culture and Personality Determined by the Natural Environment and Its Changes

T.Y D. Wickramanayake & S. Samarasekara

Department of Anthropology, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 16 October 2020
Accepted 02 June 2021
Issue Published Online
01 July 2021

**Key Words:**
Floods
Personality
Culture
Environment
Natural Disasters

*Corresponding author
E-mail address:
thamaliwickramanayake@gmail.com

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v06i02.02

VJHSS (2021), Vol. 06 (02), pp. 19-30

ISSN 1391-1937
ISSN 2651-0367 (Online)

©Faculty of Humanities and Social Sciences 2021

## ABSTRACT

*At present, the natural disasters faced by Sri Lankans are increasing day by day. Even in a catastrophic situation, it becomes integral part of cultural life when in constant conflict with life. Rather than finding solution to the problem, the study based on the persuasiveness of people to make it a blessing to their day to day lives and the nature of the new lifestyles associated with it. The objective of the research was to study the socio-cultural impact of the natural environment and its changes. According to the analytical research, the study area was selected as 435-Kahatapitiya Gramasewa Division located in Hanwella Divisional Secretariat Division. Out of the 344 indoor units the population that suffering from flood, among the population 40 households were selected and studied as 12%. The sample was selected through the judging sample, stratification sample and random sample. The findings reveal that the whole socio-cultural environment such as the economy, daily life and religious beliefs of the people living in the area are adapted to this environment. Examples including surrendering to the god Ranwala, building houses to withstand disasters and taking advantage of disasters. 58% of the respondents were of the opinion that this disaster was a common situation faced by all the people living in the lowlands and that no action could be taken to address it. Thus, it can be concluded that the socio-cultural environment in which he is grew up as well as the environment in which he brought up creates the whole personality, including the inner status of the individual. However, it should be noted that the natural environment and the natural disasters are great impact on it have a great effect on the social status, cultural background as well as the personality of the people living under that environmental background.*

**මාතෘකාව**

ස්වාභාවික පරිසරය හා එහි වෙනස්වීම් අනුව තීරණය වන සංස්කෘතිය සහ පෞරුෂය පිළිබඳ බහුවිධ අධ්‍යයනයක්

## 1. හැඳින්වීම

මිනිසා ස්වභාව ධර්මයට එරෙහි නොවන තාක්කල් ස්වභාව ධර්මය මිනිසාට ද එරෙහි නොවෙයි. නමුත් වර්තමානයේ මෙම තත්ත්වය මෙසේ නොපවති යි. අතීතයට සාපේක්ෂව වර්තමානය වන විට මිනිසා ස්වාභාවික ආපදා සඳහා වැඩි වශයෙන් මුහුණපායි. සෑම මිනිස් ක්‍රියාකාරකමක් ම සොබාදහම කෙරෙහි නොමැකෙන සලකුණු තබන බව පරිසරවේදීන්ගේ අදහස වන අතර, මෙම මානව ක්‍රියාකාරකම් සඳහා ස්වාභාවික පරිසරය දක්වන ප්‍රතික්‍රියාවන් මානවයාට අහිතකර ලෙස බලපානු ඇත. මෙලෙස මානව සංහතිය මුහුණපාන පරිසරයේ සිදුවන විපර්යාස තත්ත්වය ස්වාභාවික ආපදාවන් ලෙස හැඳින්විය හැකිය (Stromberg, 2007, p.199). ස්වාභාවික ආපදාවක් වන ජලගැල්ම හෙවත් ගංවතුර තත්ත්වය පිළිබඳ මෙම පර්යේෂණ ලිපියේ දී මූලික වශයෙන් සාකච්ඡා කරන අතර, දැඩි වර්ෂාපතනය, ජලපෝෂක පිටාර ගැලීම ආදිය නිසා සාමාන්‍යයෙන් වියළි භූමියේ සිදුවන්නා වූ විපර්යාස තත්ත්වය ජලගැල්ම වශයෙන් හැඳින්විය හැකිය (Robinson & Sivapalan, 1997, p.1281). ශ්‍රී ලංකාවේ පහත්බිම් ආශ්‍රිතව වර්ෂා කාලයේ ඇතිවන ජලගැල්ම තත්ත්වය දිනෙන් දින ඉහළ යනු ඇත. වර්තමානයේ අධික ජනගහණය හේතුවෙන් පහත්බිම් ආශ්‍රිතව ද නිවාස ඉදිවන්නේ ස්වාභාවික රීතීන් පසෙක දමමිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිසා පරිසරයට එරෙහිවීමත් සමඟ ස්වභාව ධර්මය ඊට ආපදාමය වශයෙන් ප්‍රතිචාර දක්ව යි.

මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ශ්‍රී ලංකාවේ පහත්බිම් ආශ්‍රිතව ඇතිවන ස්වාභාවික ව්‍යසනයන් සමඟ පුද්ගලයාගේ වෙනස්වන සංස්කෘතිය සහ පුද්ගල පෞරුෂය පිළිබඳ අධ්‍යයන කිරීමට උචිත අධ්‍යයන ප්‍රදේශයක් මෙම පර්යේෂණය සඳහා යොදා ගනු ලැබිණි. එනම් පූගොඩ හා කොළඹ අතර නිම්න කලාපයේ පිහිටි හංවැල්ල ප්‍රදේශය යි. ඒ ආශ්‍රිත පහත්බිම් කලාපයන්හි ජීවත් වන ජනතාවට ජලගැල්ම තත්ත්වයට සෑම වර්ෂයක ම වරක් හෝ දෙවරක් මුහුණපාන්නට සිදු වෙයි. එබැවින් මෙම තත්ත්වය මොවුනට හුරුපුරුදු අත්දැකීමකි. කාලයත් සමඟ නිරන්තරයෙන් මේ සඳහා මුහුණදෙන මිනිසාට එම තත්ත්වය තම ජීවිතයෙහි කොටසක් බවට පත්වෙයි. ආපදා තත්ත්වයක් වුව ද ජීවිතය සමඟ නිරන්තරයෙන් ගැටීමේ දී එය ඔවුන්ගේ සංස්කෘතික අංගයක් බවට පත් වනු ඇත. මෙම ගැටලුවට විසඳුම් සොයනවා වෙනුවට ඒ මත රඳා පවතිමින් එය තම ජීවිතවලට ආශිර්වාදයක් බවට පත් කර ගන්නට ඔවුන් පෙළඹී ඇත. මෙම ජීවන රටාවේ නව ප්‍රවණතා හා ඒ ආශ්‍රිත ගැටලු මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනය කර ඇත. වර්තමානය වන විට කැළණි ගං මිටියාවතේ ජනතාවගේ එදිනෙදා ජීවිතය, ආගමික පසුබිම, ආර්ථිකය මෙන් ම සමස්ත සමාජ සංස්කෘතික රටාව ම මෙම පාරිසරික තත්ත්ව යටතේ ඊට අනුකූලව සැකසී තිබෙනු පර්යේෂණය තුළින් විමසුමට ලක් කර ඇත.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් න්‍යායාත්මක හා සමාජීය අරමුණු හා පරමාර්ථයන් මුල් කරගත් අතර ප්‍රධාන අරමුණ වන්නේ ස්වාභාවික පරිසරය හා එහි වෙනස්වීම පුද්ගලයාට සිදු කරන සමාජීය සහ සංස්කෘතික බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම යි. සෙසු අරමුණු ලෙස ස්වාභාවික පරිසරය සහ සංස්කෘතිය අතර පවතින සම්බන්ධය අධ්‍යයනය කිරීම, ස්වාභාවික ආපදා සංස්කෘතියත් සමඟ බද්ධ වන ආකාරය අධ්‍යයනය කිරීම, වෙනස්වන පාරිසරික තත්ත්ව හමුවේ පුද්ගල පෞරුෂයේ සිදුවන නවමු ස්වභාවය අධ්‍යයනය කිරීම හා සංස්කෘතිය සහ ඒ මත ගොඩනැගෙන පුද්ගල පෞරුෂය සඳහා ස්වාභාවික පරිසරය බලපාන ආකාරය හඳුනා ගැනීම යි.

### 1.1 ස්වාභාවික පරිසරය සහ මානව පරිසර විද්‍යාව

යම් පුද්ගල එකතුවකින්, සියලු බාහිර ප්‍රභවයන්ගෙන් සහ සාධකවලින් සමන්විත වූවක් (Mogey 1965, p. 241) මෙන් ම ජීවියකුගේ ජීවිතයට හා සංවර්ධනයට බලපාන සියලු බාහිර තත්ත්වයන් හා බලපෑම්වල එකතුවක් ලෙස පරිසරය දැක්විය හැකිය. නිරන්තරයෙන් ජීවියා සහ බාහිර පරිසරය අතර ඉතා පැහැදිලි සහ අඛණ්ඩ අන්තර් ක්‍රියාකාරිත්වයක් පවතිනු ඇත (Bates, 1968, pp. 91-93) . අන් සියලු ජීවීන් මෙන් මිනිසා ද පරිසරය සමඟ අන්තර් සම්බන්ධතා පවත්වයි. මිනිසාගේ පරිසරය ලෙස භෞතික පරිසරය (දේශගුණය, ගංගා, කඳුවැටි) හා ජෛව පරිසරය (ශාක, සතුන්) දැක්විය හැකි ය (කුලතිලක, 1997, පි. 40). ආහාර හා

පෝෂණය, රෝගවලට ඔරොත්තුදීමේ හැකියාව ආදිය මිනිසා ලබා ගන්නේ පරිසරයේත්, සංස්කෘතියේත් සම්බන්ධතාවෙනි. පරිසරය මිනිසාට සිදුකරන බලපෑම මිනිසා පරිසරයට සිදුකරන බලපෑම යන දෙඅංශය ම මිනිසාගේ ස්වභාවය තීරණයවීමට හේතු වේ (සමරසේකර, 2005, පි. 45).

මෙලෙස මිනිසා, පරිසරය හා සංස්කෘතිය යන අංශයන්හි අන්‍යෝන්‍ය සම්බන්ධතා විමසීම භෞතික මානව විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍රයක් වන මානව පරිසර විද්‍යාව මඟින් සිදු කරනු ලබන අතර, මානව පරිසර විද්‍යාව (Human Ecology) වූ කලී මානව විද්‍යාව, සමාජ විද්‍යාව, ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉතිහාසය, භූගෝල විද්‍යාව සහ පුරාවිද්‍යාව ඇතුළු අංශ කිහිපයක විවරණ හා ක්‍රමවේද ඒකාබද්ධ කරනු ලබයි. මේ පිළිබඳ බහුකාර්ය ප්‍රවේශය මඟින් පාරිසරික යුක්තිය, තිරසාරභාවය සහ දේශපාලන පරිසර විද්‍යාව යන කරුණු පිළිබඳව පුළුල් ලෙස ආමන්ත්‍රණය කිරීමට හැකියාව ලැබේ. මානව පරිසර විද්‍යාව, මිනිසා හා ඔවුන්ගේ පරිසරය අතර අන්තර්ක්‍රියා කෙරෙහි බලපාන සාධක පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා වර්තමාන හා අතීතයේ විවිධ පරිසර පද්ධතිවල සහ විවිධ සංස්කෘතීන්හි මානව ජීවිතය හා මානව ක්‍රියාකාරකම් අධ්‍යයනය කරයි. මානව පරිසර විද්‍යාවේ මූලික ගැටලුවක් වන්නේ ස්වභාවධර්මය පිළිබඳ මිනිසුන්ගේ සංස්කෘතික විශ්වාසයන් ඔවුන්ගේ ජීවනෝපායන් සහ සමාජ පිළිවෙලට බලපාන්නේ කෙසේ ද යන්න යි. සංස්කෘතික විශ්වාසයන් සම්බන්ධයෙන් ආර්ථික විද්‍යාව වැනි නූතන විද්‍යාවන් ද සිය අවධානය යොමු කරන අතර ම මානව පරිසරවේදීන් ආර්ථික වර්ධනය හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ නවීන සංකල්ප මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බලයි. එම සංකල්ප පාරිසරික හායනය (Environmental Degradation), දේශගුණික විපර්යාස (Climate Change) සහ ගෝලීය අසමානතාව (Global Inequality) පිළිබඳ වෙනත් විද්‍යාත්මක අවබෝධයන් සමඟ සංසන්දනය කිරීමෙන් මානව පරිසර විද්‍යාව තිරසාර හා අසමාන ගෝලීය සමාජයක් තුළ පවතින අදහස්වලට අභියෝග කරයි. මානව පරිසර විද්‍යාව මිනිසා හා ඔවුන්ගේ පරිසරය අතර අන්තර්ක්‍රියා කෙරෙහි බලපාන සාධක පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා වර්තමාන හා අතීතයේ විවිධ පරිසර පද්ධතිවල සහ විවිධ සංස්කෘතීන්හි මානව ජීවිතය හා මානව ක්‍රියාකාරකම් අධ්‍යයනය සිදු කරයි (Park, 1936, p.1).

## 1.2 ස්වාභාවික ආපදා

20 වන සියවසේ මැද භාගයෙන් පසුව මිනිසාට ආපදා යන්න පිළිබඳ විශේෂ අවධානයෙන් සිටීමට මිනිසාට සිදුව ඇත්තේ ඔහු සතු විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම් සම්භාරය පුළුල් වීමත් සමඟය. ස්වභාවධර්මය නොතකා තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ විශ්වය දිනන්නට වෙර දරන මිනිසාට ස්වාභාව ධර්මය විසින් ලබාදෙන දඬුවමක් වශයෙන් ද ස්වාභාවික ආපදා හැඳින්විය හැකිය. හදිසියේ ඇති වී මානවයාට සුවිශාල බලපෑමක් සිදුකරන ස්වාභාවික ආපදාවන් කිහිපයක් සඳහා නිදසුන් වශයෙන් භූමිකම්පා, සුනාමි, සුළිකුණාටු සහ ගංවතුර තත්ත්වය දැක්විය හැකිය. 2004 වර්ෂයේ දී ඉන්දියන් සාගරයේ ඇති වූ සුනාමි ව්‍යසනය, 2010 වර්ෂයේ දී හයිටි සහ චිලී දූපත්වල සිදු වූ භූමිකම්පා තත්ත්වය ලෝක ප්‍රකට මාධ්‍ය ආවරණයක් හිමි වූ ස්වාභාවික ව්‍යසනයන් වන අතර, එමඟින් සාමාන්‍ය ජනතාවට ද මෙම ව්‍යසන තත්ත්වයන් පිළිබඳ විශාල දැනුවත්භාවයක් හිමිවිය (Cavallo et al., 2013, p.1549 ). වර්ෂ 1980 සහ 2004 අතර කාලයේ මිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්කරන්නටත්, බිලියන පහකට ආසන්න ප්‍රමාණයක් පීඩාවට පත්කරන්නටත් ස්වාභාවික ආපදාවන් සමත්වූ බව බෙල්ජියමේ ලුවියන් විශ්වවිද්‍යාලයේ (University of Louvain, Belgium) ආපදා වසංගත විද්‍යාව පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය (The Centre for Research on the Epidemiology of Disaster) දක්වයි (Stromberg, 2007, p.199 ).

## 1.3 සංස්කෘතිය

සංස්කෘතිය යනු ජීවන ගමනයි (Mead & Metraux, 1953" p. 11). එනම් යම් සමාජයක ජීවත්වන සාමාජිකයන් වශයෙන් හවුලේ බුක්ති විඳින, පරම්පරාවෙන් පරම්පරාවට ගෙන එනු ලබන ඉගෙන ගත් හැසිරීම් හා එම හැසිරීම්වල ප්‍රතිඵල මඟින් මනාව සකස් වූ රාශිය සංස්කෘතිය නම් වේ (Linton 1945" p. 32)' සංස්කෘතිය පිළිබඳ මානව විද්‍යාඥ රැල්ෆ් ලින්ටන්ගේ (Ralph Linton) විග්‍රහයෙන් එහි ස්වභාවය හා ලක්ෂණ පිළිබඳ මනා අවබෝධයක් ලබාදෙයි. ප්‍රධාන වශයෙන් ඔහු

පෙන්වාදෙන කාරණයක් වන සමාජයේ සාමාජිකයින් ලෙස 'හවුලේ බුක්ති විඳින' යන්නෙන් අදහස් වන්නේ සංස්කෘතිය සාමූහික එකතුවකින් ගොඩනැගෙන හා පවත්වාගෙන යන දෙයක් බවයි (සමරසේකර, 2005, පි. 62). සංස්කෘතිය මිනිසාගේ සමාජ උරුමයකි. සංස්කෘතිය සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකොට ගත්තාවූත් පාරම්පරික වශයෙන් ලබා ගන්නාවූත් සියලු ම චර්යා රටාවන්ට ලබාදිය හැකි සාමූහික නාමය යි (Singer, 1968, p. 527). කෙසේ වෙතත් සංස්කෘතිය වූ කලී පුද්ගලයා ජීවත් වන පරිසරයෙන් හා සමාජ වටපිටාවෙන් උරුම වන්නක් බව සඳහන් කළ හැකිය.

## 1.4 පෞරුෂය

පෞරුෂය වූකලී පුද්ගලයාගේ චර්යාව සහ චින්තනය නියතකරලීමේ මනෝ භෞතික පද්ධතීන්ගේ ගතික සංවිධානය යි (Allport, 1937/1960, p. 25). මෙහි දී වැදගත්වන සාධකයක් ලෙස පරිසරයට අනුව හැඩගැසීම, මනෝ කායික පද්ධති, ගතිකත්වය සහ සංවිධානාත්මක ඒකකයක් යන්න පෙන්වාදිය හැකිය. පුද්ගලයකුගේ පෞරුෂය උපතේ සිට මරණය දක්වා සකස් වෙමින්, වෙනස් වෙමින්, වර්ධනය වෙමින් පවතින බව මෙයින් ගම්‍ය වන අතර, පෞරුෂය යන්න නො වෙනස්ව පවතින්නක් හෝ සම්පූර්ණයෙන් ගතික දෙයක් නො වන බවත් පැහැදිලි වේ. කෙනකු සමඟ විවෘතව කතා කිරීමට වෙනස්කම් හා ගැටුම් නිර්මාණයට ඇති හැකියාව ඇතිවීම සහ නැති වීම මේ අනුව සිදු වෙයි (Hunt, 1967, p. 3). කෙසේ වෙතත් මිනිසාගේ හැසිරීම තුළින් විද්‍යමාන වන්නේ ඔහුගේ පෞරුෂය බව දැක්විය හැකි අතර එමෙන් ම පුද්ගලයා ජීවත් වන සමාජය හා සංස්කෘතිය මෙන් ම පරිසරය අදාළ පුද්ගලයාගේ පෞරුෂයට යම් බලපෑමක් සිදු කරනු ඇත.

## 1.5 ස්වාභාවික පරිසරය සහ ස්වාභාවික ආපදා මත ගොඩනැගෙන සංස්කෘතිය සහ පුද්ගල පෞරුෂය

මිනිසා පරිසරයට අනුවර්තනය වීමට විවිධ උපක්‍රම යොදා ගනියි. අවිඥානකව ජීවී මට්ටමෙන් අප පරිසරයට හැඩගැසෙන අවස්ථා ඇත. නිදසුනක් වශයෙන් අධික ශීත ප්‍රදේශවල වාසය කරන මිනිසුන්ගේ සම යට ඝන මේද ස්ථරයක් තැන්පත් වීම නිසා ශීතලෙන් ආරක්ෂාව ලැබේ. මිනිසාට මෙවැනි ජීව විද්‍යාත්මකව සිදුවන අනුවර්තනයට වඩා සවිඥානිකව සිදුවන සංස්කෘතික අනුවර්තන වැදගත් වේ. අන් සතුන්ට ජීවී මට්ටමින් පමණි පරිසරයට හැඩගැසීමට හැකියාව ඇත්තේ. නමුත් මිනිසා සත්ත්ව ලෝකයේ අද්විතීය තැනක් උසුලන්නේ සංස්කෘතික මට්ටමින් සාර්ථකව හැඩගැසීමේ හැකියාව ඇති නිසයි. අන් සතුන් අභිබවා යමින්, සංස්කෘතිය හසුරුවමින් වඩාත් පහසුවෙන් මිනිසා පරිසරයට අනුවර්තනය වේ. නිදසුනක් ලෙස ශීත පෙදෙසක වාසය කරන මිනිස්සු ඝන උණුසුම් ඇඳුම් සකසා ගනිති. (කුලතිලක, 1997). මිනිසා පරිසරයට අනුවර්තනය වීම අතර, ඊට උචිත පරිදි තම වාසස්ථාන ගොඩනඟා ගැනීම ප්‍රධාන අංගයක් විය. මේ අනුව මිනිසා සිය සංස්කෘතික වටපිටාව ද තමන් ජීවත් වන පරිසරය හා සමගාමීව ගොඩනඟා ගනු ඇත (Cohen, 1974, p.4). මේවා සංස්කෘතික අනුවර්තනයන් ය. පුද්ගලයා ජීවත් වන පාරිසරික වටපිටාව මත ඔහුගේ සංස්කෘතිය ගොඩනැගෙන අතර එමෙන් ම පුද්ගලයා තමන් ජීවත්වන පරිසරයට උචිත වන අයුරින් සිය අනුවර්තනයන් ද සංස්කෘතිය හරහා ම ගොඩනංවා ගනු ලබයි (Kluckhohn, 1962, p. 935). ඒ අනුව සාමූහික වශයෙන් උරුම කරගෙන තම අවශ්‍යතා සම්පාදනය සඳහා යොදා ගන්නා මෙවලමක් ලෙස සංස්කෘතිය හැඳින්විය හැකි අතර, එමෙන් ම එය පරිසරයට අනුව නිරන්තරයෙන් වෙනස්වන සහ සකස්වන ක්‍රියාපටිපාටියක් ලෙස ද හැඳින්විය හැකිය. ස්වාභාවික පරිසරය හා ස්වාභාවික ආපදා මානව පරිණාමයේ ආරම්භක අවධියේ පටන් ම මානවයාගේ සංස්කෘතිය ගොඩනැඟීමෙහි ලා බලපෑම් කර ඇත. පෘථිවියේ දේශගුණික තත්ත්වයන් නිරතුරු වෙනස්වන සුළුය. විටෙක ගෝලීය වශයෙන් ශීත වකවානු බලපැවැත්වෙන අතර තවත් විටෙක වඩාත් උණුසුම් කාල පරිච්ඡේද උදාවෙයි. ඕනෑ ම ජීවියකුට තමන් වෙසෙන පරිසරයෙන් සෘජුව බලපෑම් එල්ල වේ. එමෙන් ම අයහපත් දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තුදීමට සත්ත්වයෝ විවිධ උපක්‍රම භාවිත කරති. බොහෝවිට ජීවත්වන ප්‍රදේශ අතහැර වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වන අතර තවත් විටෙක වෙනස්වන පරිසරයට සුදුසු අනුවර්තන ජෛවී මට්ටමින් දියුණු කර ගනිති (කුලතිලක, 2018). මෙලෙස මානව පූර්වජයින් (Human Ancestors) සතුව වෙනස්වන පරිසර තත්ත්වයන්ට උචිත ලෙස හැඩගැසීමට මනා

හැකියාවක් පැවති බව මනාව පැහැදිලි වේ. ඒ අනුව පැහැදිලි වන්නේ මිනිසා සහ පරිසරය අතර අවියෝජනීය සබඳතාවක් පවතින බවත්, එම අවියෝජනීය සබඳතාව හේතුවෙන් මානවයා අදාළ පරිසර තත්ත්වයන්ට උචිත වන පරිදි සිය සංස්කෘතික ජීවිතය නිර්මාණය කර ගත් බව ය. සූඩානයේ ජන්මය ලද නූවර්වරුන් නිදසුනක් ලෙස දැක්වුවහොත්, වර්ෂ 1928 වනවිට නයිල් ගඟට නැගෙනහිරින් පිහිටි නූවර් ජනපදයේ ජනගහණය 320 000 පමණ සිටි බව සඳහන් වේ. නයිල් ගඟ මධ්‍යම අප්‍රිකාවෙන් පටන් ගෙන සැතපුම් 4000 ක් පමණ ගෙවා මධ්‍යධරණී මුහුදට ගලා යයි. මෙම ප්‍රදේශයේ වාසය කරන නූවර්වරුන්ට ඉතා උෂ්ණ හා ඉතා තෙතමනය සහිත ඍතු දෙකකට මුහුණ දෙන්නට සිදුවිය. වර්ෂා කාලයේ දී නයිල් ගඟ පිටාර ගලා මොවුන්ගේ නිවාස යටවෙයි. ඒ අවස්ථාවේ දී මොවුන් සිය නිවාස හැර ගොස් ගම්මානයේ උස කඳුවැටිවල හෝ තරමක් උස් බිම්වල සිය ජනාවාස පිහිටුවා ගනු ලබයි. ඔවුන් එහි රැඳී සිටිමින් මෙනේරි සහ බඩඉරිඟු වගා කොට ඇත. වර්ෂාවෙන් අනතුරුව නැවත තම වාසස්ථාන වෙත පැමිණෙයි (Evans-Pritchard: The Nuer of the Southern Sudan, n.d.). මෙම දේශගුණික තත්ත්වය මොවුන්ගේ කෘෂිකාර්මික ජීවිතයට ද පිටිවහලක් විය. ජලය බැසගිය පසු ඉතිරිවන ඉතා සාරවත් පස ගොවිතැනට ඉතා යෝග්‍ය ය (Pritchard, 1933, p.4). නූවර් වැසියෝ නයිල් නදියෙන් රිසි සේ වැඩ ගත්හ. මොවුන් නයිල් මිටියාවතේ සාරවත් පසේ තිරිඟු, බාර්ලි, මිදි හා පළතුරු වගා කළහ. ජලය බැස ගිය පසුව වර්ෂාව සමයේ දී වුව ද මොවුන් තම ඉඩකඩම් වගා කර ගනිති. වර්ෂා කාලය අවසන් වීමෙන් පසුව තෙතමනය වියළී ගිය කල්හි මොවුන් තම තණබිම් පුළුස්සා නව තණබිම් ලබා ගෙන නැවතත් සාමාන්‍ය ජීවිකාව පවත්වා ගෙන යයි (ජයතිලක, 2009). මෙම අඳුරු භූමිය පෘථිවිය මත ඇති ඉතා විශිෂ්ටතම රට යැයි මොවුන් විශ්වාස කරන අතර, ස්වභාවධර්මයට ඇඟිලි ගැසීම වෙනුවට එමඟින් ඔවුන්ට ලබා දෙන ප්‍රදානයන් පිළිබඳව ඔවුන්ගේ ඇති අචල විශ්වාසය මින් පැහැදිලි වේ. එමෙන් ම ජනයාගේ සමාජ සංස්කෘතික ජීවිතය තීරණය වනුයේ ඔවුන් ජීවත්වන මෙම පරිසර තත්ත්වයන්ට අනුව බව ඉන් මනාව පැහැදිලි වන අතර, කෙසේ වෙතත්, විටෙක ජලගැල්ම යනු සමහර ශාක හා සතුන්හට සමෘද්ධිමත්වීමට අවශ්‍ය ස්වාභාවික ජල විද්‍යාත්මක ක්‍රියාවලියක් ලෙස ද සඳහන් කළ හැකිය.

යම් සංස්කෘතියක් තුළ පාරිසරික ස්වභාවය වෙනස් වන විට එම සංස්කෘතික රටාවන් ද වෙනස් වනු ඇත. එමෙන් ම යම් ජන කණ්ඩායමක සිදුවන පාරිසරික විපර්යාසයන් මගින් එම සමාජයේ සාරධර්ම, ආකල්ප සහ පෞරුෂ ලක්ෂණ යන අභෞතික සංස්කෘතික ලක්ෂණයන් ද ඒ අනුව සකස්වනු ඇත (Edgerton, 1965, pp. 443-444). ජපානය මීට කදිම නිදසුනකි. ජපානය භූමිකම්පා සඳහා නිරන්තරයෙන් මුහුණ දෙන රටකි. ජපන් වැසියන් විශ්වාස කරන්නේ මෙම ආපදා තත්ත්වයන් තමන්ට ස්වභාවධර්මය විසින් දායාද කළ දේශයේ ස්වාභාවික තත්ත්වයක් බවයි. ඒ නිසා සියලු ම වැසියන්ට මෙම ආපදාවන්ට මුහුණ දියයුතු ආකාරය සඳහා රජය විසින් පෙර පුහුණුවීම් ලබාදීම සිදු කරයි. අතීතයේ සිට මෙම ප්‍රායෝගික පුහුණුව ජනතාවට ලබාදීමෙන් ස්වභාවික ව්‍යසනයක දී මොවුන් ඒ සඳහා ආරක්ෂිත පියවරයන් ගැනීමට සමත් වනු ඇත. ජපන් වැසියන්ගේ සංස්කෘතිය මෙන් ම පෞරුෂය රඳාපවතින ගති ලක්ෂණයන් ලෙස ස්වාභාවික පරිසරය, දේශගුණය, සමාජ සහ සංස්කෘතික බලපැවැත්ම, පවුල, ඥාතීත්වය සහ අනෙකුත් සමාජ සංවිධාන හේතු වෙයි. එසේ ම ජපන් ජනතාවගේ පෞරුෂය ගොඩනැඟීම සඳහා ස්වාභාවික ආපදා තත්ත්ව බලපානු ඇත (Thripathi, 2013). ජපන් වැසියන් සිය නිවාස ඉදි කරන්නේත් මෙම ආපදා තත්ත්වයන්ට ගැලපෙන ආකාරයට ය. එමෙන් ම දැවයෙන් කළ සුන්දර නිර්මාණයන් වන මොවුන්ගේ නිවහන් ආපදාවන්ට ඔරොත්තු දෙනු ඇත. නිවාස විනාශ වුව ද ඔවුන්ට ඉන් අලාභයක් සිදු නොවේ. මන් ද නිවාස අඩු ප්‍රාග්ධනයක් යොදා නිමවා ඇති හෙයිනි. මේ අනුව ජපන් ජනයා සිය සංස්කෘතිය ස්වාභාවික පරිසරය හා එහි වෙනස්වීමට ඔරොත්තු දෙන ආකාරයට සකසා ගෙන ඇති බව සඳහන් කළ හැකිය.

සමාජ විද්‍යාඥ රැල්ෆ් ලින්ටන් ප්‍රකාශ කරන ආකාරයට, 'සමාජය සංස්කෘතිය හා පෞරුෂය සමීප අන්‍යෝන්‍ය පරායත්තතාවකින් යුතුය ' (Linton 1957, p. 29). ඒ නිසා මේ සංකල්ප එක්කොට විවරණය කිරීම පහසු කරුණක් විය. පුද්ගලයා උපන් සමාජයට සහ සංස්කෘතියට අනුගත කරවනු ලබන සමාජානුයෝජනය පිළිබඳ කතා කිරීමේ දී පුද්ගලයාගේ පෞරුෂත්වය ගොඩනැගෙන්නේ ඔහු හැදුණු වැඩුණු සමාජ පරිසරය අනුවයි (පෙරේරා 1993, පිටු. 65-66). මෙහි දී වැදගත්වන

සාධකයක් ලෙස පරිසරයට අනුව හැඩගැසීම, මනෝ කායික පද්ධති, ගතිකත්වය සහ සංවිධානාත්මක ඒකකයක් යන්න පෙන්වාදිය හැකිය. පුද්ගලයකුගේ පෞරුෂය උපතේ සිට මරණය දක්වා සකස් වෙමින්, වෙනස් වෙමින්, වර්ධනය වෙමින් පවතින බව මෙයින් ගම්‍ය වන අතර, පෞරුෂය යන්න නොවෙනස්ව පවතින්නක් හෝ සම්පූර්ණයෙන් ගතික දෙයක් නොවන බවත් පැහැදිලි වේ. යම් සමාජයක ජීවත්වන්නා වූ පුද්ගලයන්ගේ පෞරුෂය ගොඩනැගීම සහ සංවර්ධනය කෙරෙහි මනෝ භෞතික සාධක පමණක් නොව අදාළ සමාජයේ පරිසර මූලික කොටගෙන ගොඩනැගී ඇති සංස්කෘතිය ද ඍජු ලෙස ම බලපෑම් කරනු ලබයි. එසේ ම යම් පුද්ගල පාර්ශ්වයකට හුරු-පුරුදු පරිසරයෙන් ඔවුන් වෙන් වුවහොත් එකී පරිසරය මත ගොඩනැගී ඇති සංස්කෘතිය ද වෙනස් වන බවත් එම ක්‍රියාවලිය පුද්ගල පෞරුෂය වෙනස්වීම කෙරෙහි බලපෑම් කරනු ලබයි (Benedict 1934, p. 178). ඒ අනුව භූගෝලීය කලාපයන්හි පවතින පාරිසරික තත්ත්වයන් පුද්ගල පෞරුෂය ගොඩනැගීම කෙරෙහි එකිනෙකට විෂම අයුරින් බලපෑම් කරයි. එමෙන් ම කුමන සමාජ වටපිටාවක උපත ලැබුව ද පුද්ගලයාගේ පෞරුෂත්වය එම උපන් ස්ථානය අනුව නොව ඔහු හැදී වැඩෙන පරිසර තත්ත්වයන් යටතේ තීරණය වන බව මනාව පැහැදිලිය. මන්ද? පුද්ගල පෞරුෂය ඔහු උපන් සමාජ සංස්කෘතික මෙන් ම පාරිසරික වටපිටාවේ නිර්මාණයක් වන හෙයිනි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගනු ලැබුවේ ලංකාවේ පහත්බිම් හා ඒ ආශ්‍රිත සංස්කෘතිය මනාව නිරූපණය වන්නා වූ කැළණි ගං මිටියාවතෙහි පිහිටි ප්‍රදේශයකි. එනම් කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 435 - කහටපිටිය ග්‍රාමසේවා වසමයි. භූමියේ පිහිටීම අනුව පුද්ගල සමාජ සංස්කෘතික ස්වභාවය තීරණය වේ. විශේෂයෙන් ම පහත්බිම් ආශ්‍රිතව සිදුවන ජලගැල්ම තත්ත්වය පුද්ගල පෞරුෂයට සහ සංස්කෘතියට සිදුකරන බලපෑම නිතර ක්ෂේත්‍රගත අධ්‍යයනයට හසු නොවන ක්ෂේත්‍රයක පර්යේෂණ කාර්යයෙහි නියැලීමේ අවශ්‍යතාව නිසා මෙම පර්යේෂණ ප්‍රදේශය තෝරා ගෙන ඇත. මෙම ග්‍රාමසේවා වසමට අයත් වන ගෘහස්ථ ඒකක 344න් 12% ක් වන පරිදි ගෘහස්ථ 40ක් නියදිය වශයෙන් තෝරා ගෙන අධ්‍යයනය කරනු ලැබීය. මෙහි දී විනිශ්චය නියදිය, ස්ථරායන නියදිය සහ අහඹු නියදිය යන නියැදුම් ක්‍රම යොදා ගෙන නියදිය තෝරා ගැනීම සිදු කරන ලදී. විනිශ්චය නියදිය යටතේ කැළණි ගං මිටියාවතෙහි වූ පහත්බිම්හි පිහිටි සෑම වසරක ම ගංවතුරට මුහුණපාන ගෘහස්ථ ඒකකයන් තෝරා ගනු ලබන අතර එම ඒකකයන් ස්ථරායන නියදිය යටතේ ස්ථරයන්ට වර්ග කරනු ලබයි. එනම් ඍජුව සහ වක්‍රව ජල ගැල්ම ආපදාවට ගොදුරුවීම පදනම් කරගෙනය. මෙලෙස අවසාන වශයෙන් අහඹු නියදිය පදනම් කරගෙන ඍජුව සහ වක්‍රව ජලගැල්ම ආපදාවට ගොදුරු වන පවුල් ඒකක 20 බැගින් වන පරිදි ගෘහස්ත ඒකක 40ක් තෝරා ගෙන මෙම පර්යේෂණයට අදාළ දත්ත ලබා ගන්නා ලදී. සෑම පර්යේෂණයක ම තොරතුරු ලබා ගැනීමට අනුගමනය කරන ක්‍රමය, ලබා ගන්නා තොරතුරුවල ස්වභාවය, දත්ත විශ්ලේෂණය කරන ආකාරය හා නියදිකරණය ආදී ලක්ෂණ අනුව පර්යේෂණ ක්‍රමවේදය විවිධ වේ (Borg et al., 1993). මෙවන් පර්යේෂණයක දී මිනිසා පිළිබඳවත්, ඔහුගේ ජීවන ක්‍රමය, ඇදහිලි විශ්වාස ආදී වූ සමස්ත සමාජ සංස්කෘතික රටාව පිළිබඳ පහසුවෙන් ම සහ නිරවුල්ව දත්ත ලබා ගත හැකි ක්‍රමවේදයන් ලෙස සහභාගීත්ව නිරීක්ෂණ සහ ආකෘතිමය සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් භාවිත කරන ලදී.


## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

කැළණි ගංගාව ආශ්‍රිතව ජීවත්වන හා ඒ ආශ්‍රිත ජලගැල්ම තත්ත්වයට නිරන්තරයෙන් මුහුණදෙන ජන කණ්ඩායමක් වාසය කරන හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 435 - කහටපිටිය ග්‍රාමසේවා වසම ඇසුරින් ස්වාභාවික පරිසරය, එහි වෙනස්වීම් එහි ජීවත් වන ජනතාවගේ සංස්කෘතිය සහ පෞරුෂය තීරණය කරන ආකාරය පිළිබඳ සිදුකළ මෙම විද්‍යාත්මක පර්යේෂණයට අදාළ දත්ත ලබා ගැනීමට අධ්‍යයන ප්‍රදේශයෙහි ඍජුව ජලගැල්මට මුහුණදෙන පවුල් ඒකක 20ක් සහ වක්‍රව ඒ සඳහා මුහුණපාන පවුල් ඒකක 20ක් ආදී වශයෙන් පවුල් ඒකක 40ක් යොදා ගන්නා ලදී. එහි දී සම්මුඛ පරීක්ෂණ උපලේඛනයක් මගින් ලබාගත් නැවුම් දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව මෙසේ ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව ජලගැල්මට ඍජුව සහ වක්‍රව මුහුණදෙන පවුල් ඒකකයන් පිළිබඳ මූලික තොරතුරු, ඔවුන්ගේ ජීවනෝපායන්හි අතීත සහ වත්මන්

තත්ත්වය මෙන් ම ජීවනෝපාය මාර්ගයන් සහ ඔවුන් ජීවත් වන පරිසරය අතර පවතින සහසම්බන්ධය, ජලගැල්ම සමාජ සංස්කෘතික වශයෙන් ජනතාවට බලපාන ආකාරය, මේ සඳහා රජයේ සහ පෞද්ගලික ආයතනයන්හි මැදිහත් වීම පිළිබඳ ජනතා මතය සහ ආපදා තත්ත්වය වළකා ගැනීමට හෝ පීඩා අවම කර ගැනීමට ගත හැකි පියවරයන් පිළිබඳ දත්ත දායකයින් ඉදිරිපත් කළ අදහස් හා යෝජනා ආදිය මෙහි දී විමසුමට ලක් කරනු ඇත.

අධ්‍යයන නියදියේ නිවාස 40හි සමස්ත සාමාජිකයින් සංඛ්‍යාව 163 කි. පවුල් ඒකක 40න් 85% ක් ප්‍රදේශයේ මුල් පදිංචිකරුවන් වීම පර්යේෂණයට යෝග්‍ය විය. පවුල් ඒකකයන්හි සාමාජිකයින් ප්‍රතිශත ඇසුරින් දැක්වුවහොත් සාමාජිකයින් 5ක් සිටින පවුල් ඒකක වැඩි ප්‍රතිශතයක් නිරූපණය කරයි. එනම් 27.50% කි. එමෙන් ම සාමාජිකයින් තිදෙනෙක් සහ සිව්දෙනෙක් සිටින පවුල් ඒකක ගණන සමාන අගයක් ගන්නා අතර සංඛ්‍යාත්මක වශයෙන් පවුල් ඒකක 8 බැගින් වන අතර ප්‍රතිශතයක් වශයෙන් 20% බැගින් වේ. එමෙන් ම සාමාජිකයින් හයදෙනෙක් සිටින පවුල් ප්‍රතිශතයක් වශයෙන් 15% කි. 7.50% ක ප්‍රතිශතයකින් සාමාජිකයින් එක් අයෙක් සහ දෙදෙනෙක් සිටින පවුල් ඒකක සංඛ්‍යාව නිරූපිතය. එමෙන් ම අඩුම ප්‍රතිශතයක් වශයෙන් 2.50%ක ප්‍රතිශතයකින් නිරූපණය වන්නේ සාමාජිකයින් හත් දෙනෙක් සිටින පවුල් ඒකක සංඛ්‍යාවයි. පවුල් ඒකකයන්හි ස්වභාවයන් අනුව වර්ග කළ විට පෙනී යන්නේ න්‍යෂ්ටික පවුල් 26 ක් අධ්‍යයන නියදිය තුළ වූ බවයි. එය ප්‍රතිශතයක් වශයෙන් 70% කි. එමෙන් ම සංකීර්ණ න්‍යෂ්ටික පවුල් 16% ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. සංකීර්ණ න්‍යෂ්ටික පවුලක් යනු න්‍යෂ්ටික පවුලේ සාමාජිකයින්ට අමතරව විස්තාරිත පවුලට එක් ඥාතියෙක් පමණක් අඩංගු පවුල් ඒකකයන් ය. එවැනි පවුල් ඒකක සංඛ්‍යාව 6 කි. එමෙන් ම විස්තාරිත පවුල් 9 ක් අධ්‍යයන නියදියට අඩංගු වූ අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 14% කි. මේවායේ න්‍යෂ්ටික පවුල් ඒකක ද්විත්වයක් හෝ ඊට වඩා ජීවත් වූ අතර පරම්පරා තුනක් ජීවත් වීම දක්නට ලැබිණි. එමෙන් ම අධ්‍යයන නියදිය පවුල් ඒකකයන්හි ස්වභාවය පිළිබඳ විමසන විට 70% වූ වැඩි ප්‍රතිශතයකින් න්‍යෂ්ටික පවුල් ඒකකයන් නිරූපණය වන අතර ඒ අනුව මෙම ප්‍රදේශයේ න්‍යෂ්ටික පවුල් වැඩි ප්‍රතිශතයක් පවතින බව පෙනෙයි..

ඕනෑම ජන කණ්ඩායමකට ඔවුන් ජීවත් වන පරිසරය හා බැඳුණු කුමක් හෝ ජීවනෝපාය මාර්ගයක් පවතිනු ඇත. මෙම ප්‍රදේශයේ කැළණි ගංගාව හා බැඳි ජීවනෝපාය රාශියක් අතීතයේ පැවති නමුත් වර්තමානය වනවිට ඒ තත්ත්වය වෙනස් වී ඇත. අධ්‍යයන නියදියේ පවුල් ඒකක 40 අතරින් 65% ක් ම අතීතයේ කැළණි ගඟ ආශ්‍රිත රැකියා සිදු කර ඇත.




**ප්‍රස්තාර අංක 1.** කැළණි ගඟ ආශ්‍රිත අතීත ජීවනෝපායන්


ඒ අනුව කැළණි ගඟ ආශ්‍රිත අතීත ජීවනෝපායන් සිදුකළ පිරිස් අතර 42.30%ක් වැලි ගොඩදැමීම තම ජීවනෝපාය මාර්ගය වශයෙන් සිදුකර ඇති අතර 30.70% වැලි ප්‍රවාහනය සිදුකර ඇත. එමෙන් ම 19.20% ක ප්‍රතිශතයක් කැළණි ගඟේ වැලි තොටුපලවල් පවත්වා ගෙනයාම සහ වැලි බෝට්ටු හිමිකාරීත්වය දරා ඇති අතර තවත් 7.60% ප්‍රතිශතයක් ඒ ආශ්‍රිතව ආහාර අලෙවි සැල් පවත්වා ගෙන සිට ඇත. වර්තමානයේ මෙම සියලු දෙනාට ම කැළණි ගඟ ආශ්‍රිත රැකියා සියල්ල අහිමි වී ඇත්තේ රජය මඟින් ඊට තහංචි දැමීම හේතුවෙනි. මෙම අනවසර වැලිගොඩ දැමීම වැළැක්වීමට 2015-2019 අවධියේ පැවති රජය කැළණි ගඟට කිඹුලන් ගෙන දැමූ බව ප්‍රදේශවාසීන් පවසයි. බොහෝ අවස්ථාවල මෙම කිඹුලන් දුටු පිරිස් ද වෙති. සමහරු කිඹුලන්ගේ ගොදුරු බවට පත් වන්නට ගොස් වාසනාවට දිවි ගලවා ගත් බවත් ක්ෂේත්‍ර පර්යේෂණයේ දී දැන ගන්නට ලැබිණි. ඉන් අනතුරුව නිතර ගඟට බැසීම ජනතාව සිදු නොකළ අතර ඒ අනුව සිය වෘත්තීන් ද අහිමි වූ බව ඔවුන්ගේ අදහසයි. 2021 වර්ෂයේ බලයට පත් රජය වැලි ගොඩ දැමීමට සීමාසහිතව බලපත්‍ර යම් ප්‍රමාණයක් ලබා දෙන බව පැවසුව ද එයත් තව ම ක්‍රියාත්මක නොවූ බව ජන මතයයි. කෙසේ වෙතත් වර්තමානය වන විට ඉකුත් රජය මඟින් ගෙන ඇති මෙම තීන්දුව ජනතාවට විශාල වශයෙන් බලපා ඇති බව දැන ගන්නට ලැබිණි. ඒ අනුව වර්තමානය වනවිට ගඟ හා සම්බන්ධ සියලු ම රැකියා අහිමි වීම හේතුවෙන් එම ජනතාවට වෙනත් රැකියා අවස්ථා සොයා යාමට සිදුව තිබේ.

වර්තමානය වනවිට අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට වැඩි පිරිසකගේ ජීවනෝපාය මාර්ගය වී ඇත්තේ කුලීවැඩයි. මෙසේ වර්තමානය වනවිට වැඩි වශයෙන් කුලී වැඩ සඳහා යොමු වී ඇත්තේ අතීතයේ කැළණි ගඟ ආශ්‍රිතව රැකියා කළ පිරිස බව දැන ගත හැකිවිය. ඒ අනුව ප්‍රතිශතයක් වශයෙන් 35%ක් ම කුලීවැඩ සිය ජීවනෝපාය මාර්ගය බවට පත් කර ගෙන ඇත. එමෙන් ම බොහෝ විට තරුණ පරම්පරාව ඇඟලුම්හල්, වෙනත් කර්මාන්තශාලා ආදී පෞද්ගලික ආයතනයන්හි සේවය කරනු දක්නට ලැබිණි. එමෙන් ම ගඟ ආශ්‍රිත විවිධ ක්‍රියාකාරකම් සිය ජීවිකාව කර ගත් සමහර පිරිස් ද මෙසේ වර්තමානය වනවිට විවිධ කර්මාන්තශාලාවන්හි සේවයට යොමුව ඇත. එම සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් 25% කි. එමෙන් ම ඒ හා සමාන ප්‍රමාණයක් කම්කරු වෘත්තිය සඳහා යොමු වී ඇත. මෙම ප්‍රදේශයේ සාලාව වත්ත නම් පෞද්ගලික රබර් වත්තක් හා රබර් කර්මාන්තශාලාවක් පිහිටා ඇත. මෙය ප්‍රදේශවාසීන්ට විශාල වශයෙන් රැකියා ලබා දුන් ආයතනයක් විය. අද වනවිට කැළණි ගඟේ රැකියා අහිමි බොහෝ දෙනෙක් මෙම රබර් වත්තේ කම්කරුවන්, මුරකරුවන් ලෙස සේවයට එක් වී තිබෙනු දක්නට ලැබිණි. එමෙන් ම අධ්‍යයන නියදියේ ප්‍රදේශයේ රජයේ රැකියා සිදු කරන ප්‍රතිශතය 7%ක් පමණ වූ සුලු පිරිසකි. එමෙන් ම ව්‍යාපාර කටයුතු සිදු කරන ප්‍රතිශතය 5%ක් වන අතර 3% රියදුරු වෘත්තියෙහි නිරත වී ඇත. සමස්තයක් වශයෙන් මෙම රැකියා දෙස බැලූ විට පෙනී යන්නේ මෙම ප්‍රදේශවාසීන් බොහෝ දෙනෙක් කුලීවැඩ සහ කම්කරු සේවයෙහි නිරත වන බවය.

ඕනෑම ආපදා තත්ත්වයක් අදාළ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට සමාජ සංස්කෘතික වශයෙන් විශාල බලපෑමක් ඇති කරනු ලබයි. කැළණි ගංගා මිටියාවතේ ජීවත්වන්නන්ට ජලගැල්ම නම් ස්වාභාවික ආපදා තත්ත්වය සිදුකරන බලපෑම කෙසේ ද යන්න මෙහි දී විමසුමට ලක්වේ. අතීතයේ මෙන් ම වර්තමානයේ ද ආපදා තත්ත්වය ප්‍රදේශවාසීන්ගේ ආර්ථිකය සඳහා විශාල බලපෑමක් සිදු කර ඇත. සාමාන්‍ය පරිදි මෙම ප්‍රදේශයේ වී වගාව සිදු කෙරේ. එමෙන් ම තේ, රබර්, පොල් සහ විවිධ එළවළු වගාවන් ද ඇත. මෙම සියලු ම වගාවන් ජලගැල්ම නිසා බොහෝ අවස්ථාවල විනාශ වේ. විශේෂයෙන් ම වී වගාවන් විනාශ වීම නිසා බොහෝ වසරවල විශාල ආර්ථික පරිහානියකට මුහුණ දුන් බව ජනතා මතය විය. එමෙන් ම ප්‍රදේශයේ ඉඩම් මිල පහළ යාමට ද ආපදා තත්ත්වය හේතු සාධක වී ඇත. වර්තමානය වන විට පර්චසයක් රුපියල් 35 000.00 ක් තරම් ඉතා අඩු මිලකට අලෙවි වේ යැයි කිව හැකිය. ප්‍රදේශවාසීන් පැවසුවේ මේ අනුව තම ඉඩමක් විකිණීමෙන් කිසිඳු ලාභයක් තමන්ට අත් නොවන බවයි.

අතීතයේ මෙම තත්ත්වය කෙතරම් විනාශකාරී ලෙස ඇති වුව ද කිසිදිනෙක දේපල හානියකට එහා ගිය විනාශක් සිදු වී නොමැති බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී පවුල්වල වැඩිහිටි සාමාජිකයින්ගෙන් දැන ගන්නට හැකි විය. ඔවුන් පවසන්නේ ගම්බාර රංවල දෙවිඳු තම ගම්මානය ආරක්ෂා කරන බවයි. අතීතයේ දැඩි ගංවතුර ඇති වූ හෙයින් එකල රංවල දෙවියන්ට බාරහාර වී ඉන් මිදෙන්නට උත්සාහ කළ

ගැමියන් ගංවතුර බැසගිය පසු රංවල දෙවියන්ට දේව දානය පිළියෙළ කර පූජා කරමින් බාරහාර ඔප්පු කළ බව ඔවුහු පවසති. නමුත් වර්තමානයේ රංවල දේව විශ්වාසය ප්‍රදේශයේ පැවතිය ද ආපදා තත්ත්වයේ දී මෙවන් ආගමික පිළිවෙත් ක්‍රියාත්මක නොවන බව ජනතාවගේ අදහසයි. ඊට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ අතීතයේ මෙන් විශාල වශයෙන් ජලගැල්ම තත්ත්වයක් වර්තමානයේ ඇති නොවීමයි. නමුත් වර්තමානයේ රංවල දෙවිඳුන් වෙනුවෙන් පුහුල් පහන් දැල්වීම චාරිත්‍රයක් වශයෙන් මෙම ජනතාව සිදුකරයි. කෙම්මුර දිනයන්හි දී, පොහොය දිනයන්හි දී මෙන් ම විශේෂයෙන් ජලගැල්ම අවස්ථාවන්හි දී රංවල දෙවිඳුන්ට පුහුල් පහන් දල්වා සිය ගම්මානය සුරක්ෂා කර දෙන ලෙස අයැද සිටින බව මෙහි ගම්වැසියෝ පැවසූහ. මෙම ප්‍රදේශයේ ජනතාවගේ නිවාස ඉදිවීම පිළිබඳ දැක්වීමේ දී බොහෝ දෙනා ජලගැල්මට ඔරොත්තු දෙන ලෙස නිවාස ඉදිකර තිබීම දක්නට ලැබෙයි. පස් සහ ගල් යොදා පොළොව ඔසවා නිවාස තරමක් උස් මට්ටමින් ඉදි කර තිබූ අතර එමෙන් ම තට්ටු දෙකට තැනූ නිවාස ද ක්ෂේත්‍ර පර්යේෂණය තුළ දී දැක ගන්නට හැකි විය. නමුත් එසේ නිවාස තනා ගැනීමට වත්කමක් නොමැති පිරිස සාමාන්‍ය ලෙස සිය නිවාස ඉදිකර ගෙන තිබෙන අයුරු ද නිරීක්ෂණය කළ හැකි විණි.




**ප්‍රස්තාර අංක 2.** ජලගැල්මට ඍජුව ම මුහුණපාන පවුල් ඒකක සිය නිවාස ඉදිකර තිබෙන ආකාරය

උක්ත ප්‍රස්තාරයේ ද දැක්වෙන පරිදි නියදියේ ජලගැල්මට ඍජුව ම හසු වන පවුල් ඒකක ගණන 20 කි. ඒ අතුරින් වැඩි ම ප්‍රතිශතයක් සිය නිවාස ඊට සුදුසු වන පරිදි තනා ඇති ආකාරය දැකගත හැකිවිය. එනම් 65% ක ප්‍රතිශතයක් එසේ පරිසරයට අනුකූලව සිය නිවාස තනා ගෙන ඇත. තවදුරටත් සඳහන් කළහොත් 45% ක ප්‍රතිශතයක් පාදම ඔසවා සිය නිවාස ගොඩ නංවා ඇත. 15% ක් මහල් දෙකකින් යුත් නිවාස ද 5% ක් කොන්ක්‍රීට් කණු මත සිය නිවාස ද තනා ගෙන ඇත. ඉහත දැක් වූ පරිදි ආපදාවන් පවතින බව දැන දැන ම 35% ක ප්‍රතිශතයක් සිය නිවාස තනා ගෙන නොමැති අතර ඒ සඳහා සිය ආර්ථිකය ශක්තිමත් නැති බව ඔවුහු පවසා සිටියහ. ජලගැල්ම අවස්ථාවේ දී සිය නිවාස ජලයෙන් යට වන නිසා එම දින කිහිපය පන්සල, ප්‍රජාශාලාව හෝ වෙනයම් ඥාතියකුගේ හෝ හිතවතකුගේ නිවසක රැඳී සිට පසුව ජලය බැස ගිය පසු සිය නිවාසයන්ට පදිංචියට පැමිණෙන බව ඔවුහු පවසා සිටියහ. මෙය මෙම ජනතාවට ඉතා හුරු - පුරුදු තත්ත්වයක් බව ද ක්ෂේත්‍ර අධ්‍යයනය තුළ දී පැහැදිලි විය. මේ ආකාරයට ජලගැල්මට හසු වන බව දැන දැනත් ඊට උචිත ලෙස නිවාස තනා ගත නොහැකි පිරිස් ද මෙම ප්‍රදේශයේ වාසය කරන අතර, බොහෝ දෙනා ඊට උචිත පරිදි නිවාස තනා ගැනීමට යොමු වීමෙන් පෙනී යන්නේ ජීවත් වන පරිසරයට උචිත ලෙස සිය වාසස්ථාන තනා ගන්නට මිනිසා යොමු වී ඇති බවයි. ජලගැල්ම ආපදා තත්ත්වයට මුහුණදෙන මෙම ජනතාවට බාහිරින් ලැබෙන සහනාධාර සහ උදව් උපකාර සම්බන්ධයෙන් වූ ජනමතය පිළිබඳ සිදුකළ විමසීමේ දී පැහැදිලි වන්නේ රජය මෙන් ම විවිධ පෞද්ගලික ආයතන ද මෙහි දී සිය මැදිහත්වීම් සිදු කරන බවය. එමෙන් ම රජයේ මැදිහත්වීම් මන්දගාමී බව ජනතා මතයයි. නමුත් ඒ සඳහා ප්‍රදේශයේ රජයේ නිළධාරීන් විශාල පරිශ්‍රමයක් දරන බව ප්‍රදේශවාසීන්ගෙන් මෙන් ම වසමේ ග්‍රාම නිළධාරීතුමා සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවේ දී වටහා ගත හැකි විය. නමුත් සමහර කාලවල

සිටි ඇතැම් රාජ්‍ය නිලධාරීන් මෙම ආපදා තත්ත්වයෙන් උපරි ම වාසි ද ලබා ගෙන ඇති බව ප්‍රදේශවාසීන්ගේ අදහසයි. මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ ආපදාමය තත්ත්වයක් වුව ද ඉන් උපරිම වාසි ලබා ගන්නට සමහර මිනිසුන් ඉඩහසර විවර කර ගන්නා බවය. මෙය මෙම ආපදා අවස්ථාවට පමණක් පොදු වූවක් නොව ලොව සිදුවන සෑම ආකාරයේ ම ආපදාමය තත්ත්වයක දී මෙවන් තත්ත්ව ඇති විය හැකිය. බොහෝ දෙනාගේ අදහස වූයේ රජයට වඩා පෞද්ගලික ආයතනයන්හි මැදිහත් වීම ඉහළ මට්ටමක පවතින බවයි. නමුත් රජයෙන් ද මූල්‍යමය ආධාර හා වියළි සලාක ද ලැබී ඇත. නමුත් රජය විසින් විශේෂ කොට ආධාර ලබා දෙන්නේ නිශ්චිත ආදායම් මාර්ගයක් නොමැති වූවන්ට වන අතර, ස්ථිර රැකියා සහිත පවුල්වලට ආධාර හිමි නොවන බව දත්ත දායකයෝ ප්‍රකාශ කළහ. ඒ අනුව ස්ථිර රැකියාවක් සිදු කළ ද සිදු වූ විපත සැමට ම පොදු නිසා සැමදෙනාට ම නිසි ලෙස ආධාර ලබා දෙන්නේ නම් එය සාධාරණ බව ජනතා මතය යි. සැම දෙනා ම එක ම ආකාරයකට එක ම ආපදා තත්ත්වයකට මුහුණ දෙන අවස්ථාවක සෑම දෙනාට ම එම ආධාර හිමි විය යුතුය. ජනතාවගේ එම ඉල්ලීම සාධාරණ ය. එමෙන් ම කිසි දිනක සිදු වූ ආපදාවට සාධාරණයක් ඉටු නො වූ බව ඔවුහු පැවසූහ. එය තමන්ට විඳ දරාගන්නට සිදු වූවක් බව ජනමතය විය. එමෙන් ම වක්‍රව මෙම ආපදාවට ගොදුරුවන ජනතාව ද ව්‍යසන සමයේ දී දැඩි පීඩාවට ලක්වන බව ජනතා මතයයි. ඒ අනුව මෙම ජනතාව අතර ආපදා සමයේ ආධාර හිමි වූ පවුල් මෙන් ම ආධාර කිසිවිටෙක හෝ හිමි නො වූ පවුල් ඒකකයන් ද වන බව ක්ෂේත්‍ර පර්යේෂණයේ දී අනාවරණය කර ගත හැකි විය. ආපදා තත්ත්වය වළකා ගැනීමට හෝ පීඩා අවම කර ගැනීමට ගත හැකි පියවරයන් පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කළ සහ නොකළ පිරිස ප්‍රතිශතයක් වශයෙන් ගත් විට අදහස් ඉදිරිපත් නොකළ පිරිස 58% කි. ඒ පිළිබඳ මොවුනට කිසිඳු අදහසක් නොමැති බව පෙනී යයි. ඉන් තහවුරු වන්නේ ඇතැම්විට දත්ත දායකයින්ට ආපදා තත්ත්ව පිළිබඳ දැනුමක් නොමැති නිසා ඒවා වළක්වා ගැනීමට ද අවබෝධයක් නොමැති බවයි. එනම් මෙම ආපදා තත්ත්වය මත ම රැඳෙන ඔවුන් එය තමන්ගේ ජීවිතයේ සහ සංස්කෘතියේ කොටසක් බවට පත් කර ගෙන ඇති බවය. එමෙන් ම ඔවුන්ගේ පුද්ගල පෞරුෂය මෙන් ම සංස්කෘතිය ද ඒ මත ම යැපෙන ලෙස සැකසී ඇති බව ඉන් මනාව තහවුරු වෙයි. කෙසේ වෙතත් සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය මඟින් පැහැදිලි කළ න්‍යායක් මෙම ජන කොටසින් මනාව විග්‍රහවනු ඇත. එනම් මානවයාගේ සියල්ල ගොඩනැගෙන්නේ ඔවුන් ජීවත්වන පරිසරය මඟින් වන බවයි. මේ අනුව මෙම ජනතාව තමන් ජීවත් වන පරිසරයට අනුකූලව සිය සංස්කෘතිය සහ පෞරුෂය ගොඩනගා ගෙන ඇති බව පෙනී යයි. ඒ අධ්‍යයන නියදියේ පවුල් ඒකක 40න් වැඩි ප්‍රතිශතයක් මෙසේ මේ සඳහා කිසිඳු අදහසක් ප්‍රකාශ නොකළ අතර, එමෙන් ම ඉතිරි පිරිස එනම් ප්‍රතිශතයක් වශයෙන් 42% ක් මේ සඳහා විවිධ යෝජනා සහ අදහස් ප්‍රකාශ කළහ. ඔවුන් පවසා සිටින්නේ ගඟේ ඉවුරු බාදනය වළකා ගැනීමට රජය මෙන් ම පරිසර අධිකාරිය ද මැදිහත් වී යම් පියවරක් ගැනීම සුදුසු බවයි. ඒ අනුව ඉවුරු බාදනය වැළැක්වීමට ගං ඉවුර දෙපස ගස් සිටුවීම, ගල් වැටියක් බැඳීම සම්බන්ධයෙන් ඔවුන් විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් කළහ.

## 4. නිගමනය සහ නිර්දේශ

උක්ත ප්‍රස්තාරයේ ද දැක්වෙන පරිදි නියදියේ ජලගැල්මට ඍජුව ම හසු වන පවුල් ඒකක ගණන 20 කි. ඒ අතුරින් වැඩි ම ප්‍රතිශතයක් සිය නිවාස ඊට සුදුසු වන පරිදි තනා ඇති ආකාරය දැකගත හැකිවිය. එනම් 65% ක ප්‍රතිශතයක් එසේ පරිසරයට අනුකූලව සිය නිවාස තනා ගෙන ඇත. තවදුරටත් සඳහන් කළහොත් 45% ක ප්‍රතිශතයක් පාදම ඔසවා සිය නිවාස ගොඩ නංවා ඇත. 15% ක් මහල් දෙකකින් යුත් නිවාස ද 5% ක් කොන්ක්‍රීට් කණු මත සිය නිවාස ද තනා ගෙන ඇත. ඉහත දැක් වූ පරිදි ආපදාවන් පවතින බව දැන දැන ම 35% ක ප්‍රතිශතයක් සිය නිවාස තනා ගෙන නොමැති අතර ඒ සඳහා සිය ආර්ථිකය ශක්තිමත් නැති බව ඔවුහු පවසා සිටියහ. ජලගැල්ම අවස්ථාවේ දී සිය නිවාස ජලයෙන් යට වන නිසා එම දින කිහිපය පන්සල, ප්‍රජාශාලාව හෝ වෙනයම් ඥාතියකුගේ හෝ හිතවතකුගේ නිවසක රැඳී සිට පසුව ජලය බැස ගිය පසු සිය නිවාසයන්ට පදිංචියට පැමිණෙන බව ඔවුහු පවසා සිටියහ. මෙය මෙම ජනතාවට ඉතා හුරුපුරුදු තත්ත්වයක් බව ද ක්ෂේත්‍ර අධ්‍යයනය තුළ දී පැහැදිලි විය. මේ ආකාරයට ජලගැල්මට හසු වන බව දැන දැනත් ඊට උචිත ලෙස නිවාස තනා ගත නොහැකි පිරිස් ද මෙම ප්‍රදේශයේ වාසය කරන අතර, බොහෝ දෙනා ඊට උචිත පරිදි නිවාස තනා

ගැනීමට යොමු වීමෙන් පෙනී යන්නේ ජීවත් වන පරිසරයට උචිත ලෙස සිය වාසස්ථාන තනා ගන්නට මිනිසා යොමු වී ඇති බවයි.

ජලගැල්ම ආපදා තත්ත්වයට මුහුණදෙන මෙම ජනතාවට බාහිරින් ලැබෙන සහනාධාර සහ උදව් උපකාර සම්බන්ධයෙන් වූ ජනමතය පිළිබඳ සිදුකළ විමසීමේ දී පැහැදිලි වන්නේ රජය මෙන් ම විවිධ පෞද්ගලික ආයතන ද මෙහි දී සිය මැදිහත්වීම් සිදු කරන බවය. එමෙන් ම රජයේ මැදිහත්වීම් මන්දගාමී බව ජනතා මතයයි. නමුත් ඒ සඳහා ප්‍රදේශයේ රජයේ නිළධාරීන් විශාල පරිශ්‍රමයක් දරන බව ප්‍රදේශවාසීන්ගෙන් මෙන් ම වසමේ ග්‍රාම නිළධාරීතුමා සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවේ දී වටහා ගත හැකි විය. නමුත් සමහර කාලවල සිටි ඇතැම් රාජ්‍ය නිලධාරීන් මෙම ආපදා තත්ත්වයෙන් උපරි ම වාසි ද ලබා ගෙන ඇති බව ප්‍රදේශවාසීන්ගේ අදහසයි. මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ ආපදාමය තත්ත්වයක් වුව ද ඉන් උපරිම වාසි ලබා ගන්නට සමහර මිනිසුන් ඉඩහසර විවර කර ගන්නා බවය. මෙය මෙම ආපදා අවස්ථාවට පමණක් පොදු වූවක් නොව ලොව සිදුවන සෑම ආකාරයේ ම ආපදාමය තත්ත්වයක දී මෙවන් තත්ත්ව ඇති විය හැකිය. බොහෝ දෙනාගේ අදහස වූයේ රජයට වඩා පෞද්ගලික ආයතනයන්හි මැදිහත් වීම ඉහළ මට්ටමක පවතින බවයි. නමුත් රජයෙන් ද මූල්‍යමය ආධාර හා වියළි සලාක ද ලැබී ඇත. නමුත් රජය විසින් විශේෂ කොට ආධාර ලබා දෙන්නේ නිශ්චිත ආදායම් මාර්ගයක් නොමැති වූවන්ට වන අතර, ස්ථිර රැකියා සහිත පවුල්වලට ආධාර හිමි නොවන බව දත්ත දායකයෝ ප්‍රකාශ කළහ. ඒ අනුව ස්ථිර රැකියාවක් සිදු කළ ද සිදු වූ විපත සෑමට ම පොදු නිසා සෑමදෙනාට ම නිසි ලෙස ආධාර ලබා දෙන්නේ නම් එය සාධාරණ බව ජනතා මතය යි. සෑම දෙනා ම එක ම ආකාරයකට එක ම ආපදා තත්ත්වයකට මුහුණ දෙන අවස්ථාවක සෑම දෙනාට ම එම ආධාර හිමි විය යුතුය. ජනතාවගේ එම ඉල්ලීම සාධාරණ ය. එමෙන් ම කිසි දිනක සිදු වූ ආපදාවට සාධාරණයක් ඉටු නො වූ බව ඔවුහු පැවසූහ. එය තමන්ට විඳ දරාගන්නට සිදු වූවක් බව ජනමතය විය. එමෙන් ම වක්‍රව මෙම ආපදාවට ගොදුරුවන ජනතාව ද ව්‍යසන සමයේ දී දැඩි පීඩාවට ලක්වන බව ජනතා මතයයි. ඒ අනුව මෙම ජනතාව අතර ආපදා සමයේ ආධාර හිමි වූ පවුල් මෙන් ම ආධාර කිසිවිටෙක හෝ හිමි නො වූ පවුල් ඒකකයන් ද වන බව ක්ෂේත්‍ර පර්යේෂණයේ දී අනාවරණය කර ගත හැකි විය. ආපදා තත්ත්වය වළකා ගැනීමට හෝ පීඩා අවම කර ගැනීමට ගත හැකි පියවරයන් පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කළ සහ නොකළ පිරිස ප්‍රතිශතයක් වශයෙන් ගත් විට අදහස් ඉදිරිපත් නොකළ පිරිස 58% කි. ඒ පිළිබඳ මොවුනට කිසිඳු අදහසක් නොමැති බව පෙනී යයි. ඉන් තහවුරු වන්නේ ඇතැම්විට දත්ත දායකයින්ට ආපදා තත්ත්ව පිළිබඳ දැනුමක් නොමැති නිසා ඒවා වළක්වා ගැනීමට ද අවබෝධයක් නොමැති බවයි. එනම් මෙම ආපදා තත්ත්වය මත ම රැඳෙන ඔවුන් එය තමන්ගේ ජීවිතයේ සහ සංස්කෘතියේ කොටසක් බවට පත් කර ගෙන ඇති බවය. එමෙන් ම ඔවුන්ගේ පුද්ගල පෞරුෂය මෙන් ම සංස්කෘතිය ද ඒ මත ම යැපෙන ලෙස සැකසී ඇති බව ඉන් මනාව තහවුරු වෙයි. කෙසේ වෙතත් සංස්කෘතික පෞරුෂවාදී න්‍යාය මඟින් පැහැදිලි කළ න්‍යායක් මෙම ජන කොටසින් මනාව විග්‍රහවනු ඇත. එනම් මානවයාගේ සියල්ල ගොඩනැගෙන්නේ ඔවුන් ජීවත්වන පරිසරය මඟින් වන බවයි. මේ අනුව මෙම ජනතාව තමන් ජීවත් වන පරිසරයට අනුකූලව සිය සංස්කෘතිය සහ පෞරුෂය ගොඩනගා ගෙන ඇති බව පෙනී යයි. ඒ අධ්‍යයන නියදියේ පවුල් ඒකක 40න් වැඩි ප්‍රතිශතයක් මෙසේ මේ සඳහා කිසිඳු අදහසක් ප්‍රකාශ නොකළ අතර, එමෙන් ම ඉතිරි පිරිස එනම් ප්‍රතිශතයක් වශයෙන් 42% ක් මේ සඳහා විවිධ යෝජනා සහ අදහස් ප්‍රකාශ කළහ. ඔවුන් පවසා සිටින්නේ ගඟේ ඉවුරු ඛාදනය වළකා ගැනීමට රජය මෙන් ම පරිසර අධිකාරිය ද මැදිහත් වී යම් පියවරක් ගැනීම සුදුසු බවයි. ඒ අනුව ඉවුරු ඛාදනය වැළැක්වීමට ගං ඉවුර දෙපස ගස් සිටුවීම, ගල් වැටියක් බැඳීම සම්බන්ධයෙන් ඔවුන් විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් කළහ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ

කුලතිලක, එස්. (1997). *මිනිසා සත්ත්වයෙකි.* නාවින්නඃ කර්තෘ ප්‍රකාශන.

කුලතිලක, එස්. (2018). *මානව අතීතය.* නුගේගොඩඃ සරසවි ප්‍රකාශන.

ජයතිලක, වයි. ඩී. (2009). *ආදිවාසී සමාජ - 1.* පන්නිපිටියඃ කර්තෘ ප්‍රකාශන.

පෙරේරා, බී. ඒ. ටී. (1993). *මානව විද්‍යා හා සමාජ විද්‍යා ප්‍රවේශය*. කොළඹ-10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ ප්‍රකාශන.

සමරසේකර, එස්. (2005). *මානව විද්‍යා මූලධර්ම.* නුගේගොඩ: කර්තෘ ප්‍රකාශන.

Allport, G. W. (1937/1960). *Personality-A Psychological Interpretation*. London: Constable & Company LTD.

Bates, M. (1968). 'Environment', in LS David (ed.). *International Encyclopedia of Social Sciences*. New York: The Free Press.

Benedict, R. (1934). *Patterns of Culture*. Boston: Houghton Miffin Company.

Borg, W. R., Gall, J. & Gall, C. G. (1993). *Applying Educational Research: A Practical Guide.* New York: Longman.

Cavallo, E., Galiani, S., Noy, I. & Pantano, J. (2013). Catastrophic Natural Disasters and Economic Growth. *The Review of Economics and Statistics, 95*(5), 1549-1561. Retrieved from http://www.jstor.org/stable/43554847

Cohen, Y.A. (1974). *Man in Adaptation: The Cultural Present (2nd ed.).* New York: Aldine Publishing Company.

Crystal, D. (2002). *Penguin Encyclopedia*. London: Penguin Books LTD.

Edgerton, R. (1965). Cultural vs. Ecological Factors in the Expression of Values, Attitudes, and Personality Characteristics. *American Anthropologist* New Series, *67*(2), 442-447. Retrieved from http://www.jstor.org/stable/668259

*Evans - Pritchard: The Nuer of the Southern Sudan* (n.d.). Retrieved from https://instruct.uwo.ca/anthro/301/eppoli.htm

Hunt, R (Ed.). (1967). 'Freud's Psychoanalylic Theory of Personality', *Personalities and Cultures*, New York: The Natural History Press.

Kluckhohn, Clyde. (1962). *Culture and Behavior: The Collected Essays of Clyde Kluckhohn*. Free Press.

Linton, R. (1945). *The Cultural Background of Personality*. New York: D. Appleton Century Company.

Linton, R. (1957). *The Tree of Culture*. New York: Alford A. Knopf.

Mead, M. & Metraux, R. (1953). *The Study of Culture at a Distance: A Prototype*. Chicago: University of Chicago Press.

Mogey, J. (1965) 'Environment', in G Julius & LK William (eds.). *A Dictionary of Social Sciences*. New York: The Free Press.

Pritchard, E. E. (1933). The Nuer: Tribe and Clan. *Sudan Notes and Records. 16*(1), 1-53. Retrieved from http://www.jstor.org/stable/41716046

Robinson, J. S. & Sivapalan, M. (1997). Temporal Scales and Hydrological Regimes: Implications for Flood Frequency Scaling. *Water Resources Research*, *33*(12), 2981-2999. Retrieved from https://doi.org/10.1029/97WR01964

Singer, M. (1968). 'Culture', in LS David (ed.). *International Encyclopedia of Social Sciences*. New York: The Free Press.